කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VIII/I2

ඔබේ අංකය / உமது எண் / Your No:

දිනය / திகதி / Date: 2018.09.05

චක්‍රලේඛ/ආර්.ඕ.පී/පී.සී.එස්/2018/2

සියලුම ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන ප්‍රධානීන් වෙත,

## අධි අවදානම් ඩෙංගු වාහක මදුරුවන් බෝවීම පාලනය කිරීමේ දී ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන සතු කාර්යභාරය

ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන විසින් මහජන සෞඛ්‍ය හා මහජන පීඩාකාරී රෝග වාහක මදුරුවන් මර්දනය කිරීම සඳහා කෘමිනාශක ධූමකරණය ක්‍රමවේදයට වඩා මදුරුවන් බෝවන ජලප්‍රභව ආශ්‍රිත කීටනාශනය සැළකිය යුතු සාර්ථකත්වයක් ඇති කරන බව විද්වත් මතය වී ඇත. විශේෂයෙන්ම නාගරික පරිසරවල සිදුකෙරෙන ඉදිකිරීම් ආශ්‍රිතව සැළකිය යුතු කීට ගහණයන් පවතින ස්ථාන (ජලය රැස් කිරීමේ ටැංකි, කොන්ක්‍රීට් ජල රැඳවුම් ආදිය) ඇති බව මූළික සමීක්ෂණවල දී අනාවරණය වී ඇති බැවින් එවැනි ස්ථාන සඳහා පළිබෝධ පාලන ආයතනවල සේවා සැපයුම සහ විශේෂඥ සහාය අත්‍යාවශ්‍ය විය හැකි ය.

02. කීටනාශනයේ දී මූළික වශයෙන් සිදු කෙරෙන්නේ මදුරු කීටයින් බෝවිය හැකි ස්ථානවලට කීටනාශක කෘමිනාශක යෙදීම යි. මෙහි ඇති විශේෂත්වය වනුයේ ජලජ පෘෂ්ඨය මත (surface) හෝ ඊට වහාම පහළ (sub-surface) ස්ථරයක සැළකිය යුතු කාල සීමාවක් අවලම්භනය වී කෘමිනාශක සංයෝගය රැඳී පවතින පරිදි සංයෝග සකස් වී තිබීම යි. පාවෙන කැට වශයෙන් සකස් කර ඇති සංයෝග ජලයේ ඝණත්වයට වඩා අඩු බැවින් සැළකිය යුතු කාලයක් මදුරු කීටයින්ගේ ශරීරයේ රසායන තැවරීමට හෝ ආහාර මාර්ගය ඔස්සේ රසායන ශරීරගත වීමට අවස්ථාව සැලසේ. ශාක පත්‍ර මත හෝ පත්‍ර කොපු හෝ කොලපු තුළ ජීවත්වන මදුරු කීටයින් විනාශ කිරීම සඳහා මෙන් ම බීමට ගන්නා ජල ටැංකිවල මදුරු කීටයින් විනාශ කිරීම සඳහා ද කැට ආකාර කීටනාශක භාවිතා වේ.

03. කෘමි වර්ධක පාලක මගින් මදුරු කීටයින් සුහුඹුල් මදුරුවන් බවට පත්වීම වලක්වනු ලැබේ. මදුරු මර්දනයේ දී කීටනාශනය සඳහා කෘමි වර්ධක පාලක නව්‍ය ආකාරයෙන් භාවිතා කළ හැකි බවට තොරතුරු ද පවතී. භාජන තුළ රැඳී පවතින ජලයේ බෝ වීම සිදුවන ඊඩිස් විශේෂයට අයත් මදුරුවන්, අවශේෂ ප්‍රතිකාර ලෙස යොදන ලද ශරීරයේ තැවරීගත් පයිරිප්‍රොක්සිෆෙන් වැනි කෘමි වර්ධක පාලක බෝවීමේ ස්ථාන වෙත ගෙන යාමෙන් (auto-dissemination) මදුරු කීටයින් සුහුඹුලන් බවට පත් නො වන බවත්, පයිරිප්‍රොක්සිෆෙන් මගින් වැඩුණු මදුරුවන්ගේ ජීවිත කාලය අඩු කරන බවත් බිත්තර දැමීමේ හැකියාව අඩපණ කරන බවත් සඳහන් කර ඇත. බැසිලස් තුරින්ජියෙන්සිස් (බී.ටී.අයි.) බැක්ටීරියානු ඩෙල්ටා-එන්ඩොටොක්සින් විෂ ස්ඵටික ආමාශගත වීමෙන් මදුරු කීටයින්ගේ ආහාර මාර්ගයේ සංකූලතා ඇතිවීම ආහාර ගැනීම සහ ආහාර ජීර්ණය අඩපණ වීමටත් ඒ මඟින් මදුරු කීටයින් නිරාහාරව මරණයට පත්වීමටත් හේතු වේ. ජල පෘෂ්ඨ මත ඉතා තුනී පටලයක් වශයෙන් පොලිඩයිමීතයිල්සිලොක්සේන් (polydimethylsiloxane) වැනි ඕගැනෝසිලිකෝන් සංයෝග යෙදූවිට මදුරු කීටයින් සහ පිලවුන් ජල ස්තරවල පහළට ගිලීයාම සහ ස්වසන බාධක ලෙස ක්‍රියා කිරීමෙන් මදුරුවන් බෝවීම පාලනය වේ.

ඔබගේ, ඔබගේ ආදරනීයයන්ගේ, මුළු මහත් සමාජයේ සහ වන සත්ත්වයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වගකීමෙන් යුතුව පළිබෝධනාශක භාවිතා කරමු
உங்களதும், உங்கள் அன்புக்குரியவர்களினதும், முழு சமூகத்தினதும் மற்றும் எல்லா உயிரிணங்களினதும் பாதுகாப்பை
உறுதி செய்வதற்காக பீடைநாசினிகளை அவதானத்துடனும் பொறுப்புடனும் பாவனை செய்வோம்
Let's act together to protect you, your loved ones, entire society & wildlife by responsible use of pesticides

04. 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි රසායන කීටනාශක සඳහා උදාහරණ පහත සඳහන් වේ.

- ටෙමිපොස් (temephos)
- පිරිමිපොස්-මෙතිල් (pirimiphos-methyl)
- පයිරිප්‍රොක්සිෆෙන් (pyriproxyfen)
- බැසිලස් තුරින්ජියෙන්සිස් ඊශ්‍රායෙලෙන්සිස් උප විශේෂය (බී.ටී.අයි.) *Bacillus thuringiensis* sub species *israelensis* (Bti)
- පොලිඩයිමීතයිල්සිලොක්සේන් (polydimethylsiloxane)

05. මදුරු කීටයින්ගේ ස්නායු ක්‍රියාකාරිත්වය අඩපණ කරන ටෙමිෆොස් (temephos) වැනි ඕගනෝපොස්ෆේට් කෘමිනාශක භාවිතය තවදුරටත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ඩෙංගු මර්දන ඒකකය සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ අනුදැනුම මත පමණක් සිදු කෙරෙන බව අවධාරණය කරමි.

06. මේ අතර, මදුරු මර්දන වැඩසටහන් සඳහා සුහුඹුල් මදුරු මර්දන කෘමිනාශක (උදා: ධූමකාරක) භාවිතය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ අනුදැනුම හා නිසි අධීක්ෂණය යටතේ චක්‍රලේඛ/ආර්.ඕ.පී/පී.සී.එස්./2017/1 ප්‍රකාරව තවදුරටත් සිදුවිය යුතුවීම අත්‍යාවශ්‍ය වේ. රෝග වාහක මදුරුවන් මර්දනය කිරීමේ ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන විසින් රසායන කීටනාශක භාවිතා කිරීමේ දී ලේබල නිර්දේශ අනුගමනය කරමින් මදුරු මර්දන සේවා සිදු කිරීම ප්‍රමුඛතා කාර්යයක් ලෙස සලකා කටයුතු කළ යුතු බවට උපදෙස් ලබා දෙමි.

මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් කරුණාකර මා වෙත දන්වා එවන්න.

ආචාර්ය ජේ.ඒ. සුමිත්
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත් -

1. ලේකම් - සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශය -කා.දැ.ස.
2. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් -කා.දැ.ස.
3. අධ්‍යක්ෂ - මැලේරියා මර්දන ඒකකය -කා.දැ.ස.
4. අධ්‍යක්ෂ - ජාතික ඩෙංගු මර්දන ඒකකය -කා.දැ.ස.